කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
බාහිර විභාග අංශය
වාණිජ්‍ය හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වයාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010
2012 ජනවාරි

**BMGT E 2065 – සංවිධාන න්‍යාය හා සැකැස්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

01. පහත සිද්ධිය කියවා අවසානයේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

<u>විචිත්‍ර ප්‍රචාරණ නියෝජිත ආයතනය</u>

විචිත්‍ර ප්‍රචාරණ නියෝජිත ආයතනය සිය පාරිභෝගිකයන්ට මූලික සේවා දෙකක් සපයන මධ්‍ය පරිමාණ ආයතනයකි. පළමු වැන්න වන්නේ ප්‍රචාරණ ක්‍රියාමාලාවන්වල අන්තර්ගතයන් සඳහා ඒ ඒ පාරිභෝගිකයාට සුවිශේෂ වූ සැලසුම් (නිදසුන් ලෙස උදෙෘාග පාඨ සහ පිරිසැලසුම්) සහ දෙවැන්න වන්නේ මාධ්‍ය (ගුවන්විදුලි, රූපවාහිනී, පුවත්පත්, වෙළඳ දැන්වීම් පුවරු සහ සඟරා වැනි) සඳහා වූ පරිපූර්ණ සැලසුම්ය. අමතර සේවා ලෙස අලෙවිකරණය සඳහා ආධාර සහ නිෂ්පාදිතය බෙදා හැරීම සහ ප්‍රචාරණ ඵලදායිතාවය පිරික්සීම සඳහා අලෙවිකරණ පර්යේෂණ සිදු කිරීම ඇතුළත් වේ.

සියළුම වැඩ කටයුතු සාම්ප්‍රදායික ආකාරයට සංවිධානය කර ඇත. සෑම සේවාදායක ගිණුමක්ම සමායෝජනය කරනු ලබන්නේ සේවාදායකයා සහ මෙහෙයුම් හා අලෙවිකරණ අංශවල වෘත්තීය කාර්යමණ්ඩලයේ සිටින විවිධ විශේෂඥයන් අතර සම්බන්ධීකාරක ලෙස කටයුතු කරන ගිණුම් විධායකයෙකි. සේවා දායකයන් සහ විචිත්‍රහි විශේෂඥයන් අතර, සේවා දායකයන් සහ ගිණුම් විධායකයන් අතර, විචිත්‍රහි විශේෂඥයන් සහ ගිණුම් විධායකයන් අතර සෘජු සන්නිවේදනයන් සහ සම්බන්ධතාවයන් සමූහයක් පැවතී ඇත.

ආයතනයේ විශේෂඥයන් සහ සේවාදායකයන් අතර සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීමට ගිණුම් විධායකයකු පත් කර තිබුනද සේවාදායක සහ විශේෂඥයන් අතර සෘජු සන්නිවේදනයන් නිතරම ඇතිවනවාසේම ගිණුම් විධායකව මඟහරිනුද ලබයි. රැස්වීම්, දුරකථන ඇමතුම් හා ලිපි වැනි පුළුල් පරාසයක පවතින අන්තර් ක්‍රියාවන් මෙම සෘජු සම්බන්ධතා තුළ අන්තර්ගත වේ. නියෝජිත ආයතනයේ විශේෂඥයන් සහ සේවාදායක සංවිධානයේ සිය රැකියාවට සමාන රැකියාව කරන්නන් අතර විශාල ප්‍රමාණයක සෘජු සංනිවේදනයන් ඇතිවී ඇත. නිදසුනක් වශයෙන් සේවාදායක ගිණුම් සංචිතයෙහි සිටින එක් සාමාජිකයෙකු වන කලා විශේෂඥයකු විසින් විචිත්‍රහි සාමාජිකයකු ලෙස වැඩ කරන කලා විශේෂඥයකු විසින් විචිත්‍රහි සාමාජිකයකු ලෙස වැඩකරන කලා විශේෂඥයාව සෘජුව සම්බන්ධ කරගනු ලබයි.

වෘත්තීය පද්ධති ක්‍රියාත්මක වනුයේ මෙහෙයුම් (රූපවාහිනී/ ගුවන් විදුලි නිෂ්පාදන දෙපාර්තමේන්තුව/ කලා දෙපාර්තමේන්තුව වැනි) දෙපාර්තමේන්තු සහ අලෙවිකරණ දෙපාර්තමේන්තුව මගිනි. සෑම දෙපාර්තමේන්තුවක්ම ධූරාවලියට අනුව අධ්‍යක්ෂවරයකු, සහකාර අධ්‍යක්ෂවරයකු සහ අධිකාරීත්වයේ නොයෙක් මට්ටම් සමඟ සංවිධානය කර ඇත. වෘත්තීය සංනිවේදනය පුළුල්ව පැතිරී

ඇති අතර දැනුම සහ ශිල්ප ක්‍රම බෙදාහැරීම සහ කාර්යන් තාක්ෂණිකව ඇගයීම පිළිබඳ වැඩිපුර සැලකිලිමත් වේ. ඒ ඒ දෙපාර්තමේන්තුවේ පාලනය පවත්වා ගන්නේ බහුලවම උසස්වීම් දීමේ පාලනය සහ යටත් සේවකයන් කරන ලද කාර්යන් අධීක්ෂණය හරහාය. කෙසේ නමුත් බොහෝ විධායකයන් හට වැඩි බලපෑම් කිරීමක අවශ්‍යතාවය හැඟෙන අතර එක් අයෙක් මෙසේ පවසයි.

"නිර්මාණශීලීත්වය සහ කලාව මෙහෙ වටෙන්ම මට ඇහෙන්නේ එපමණයි තමන් කැමති දෙයක් කිරීමට හැකි බවට බලපුළුවන්කම් පාන තමන් සුපිරියැයි සිතාගත් හය හත් දෙනෙක් ඵලදායීව කළමනාකරණය කිරීම අපායක් වගෙයි. ඔවුන් එකිනෙකා උත්සාහ කරනුයේ ඔහුගේ හෝ ඇයගේ අදහස සේවාදායකයාට විකිණීමට හා බොහෝ අවස්ථාවලදී කුමක්ද සිදුවී ඇත්තේ යන්න සතියක් පසුවන තුරුත් මා දන්නේ නෑ. මම පරම බලධාරී පාලකයා වුවහොත් අනුමැතිය ලබා ගැනීම සඳහා පළමුව මා සමඟ කටයුතු කලයුතු බවට ඔවුන් සියල්ලම පත් කරනවා. මෙහි පවතින දේවල් අනිවාර්යයෙන්ම වෙනස්වේවි"

පාරිසරික වෙනස්කම් මගින් ප්‍රතිසංවිධානය වීමේ අවශ්‍යතාවය තීව්‍ර කර ඇත. කෙටිකාලයක් තුළදී නියෝජිත ආයතනය විසින් හසුරුවන ලද ප්‍රධාන ගිණුම් සීඝ්‍රයෙන් ඉවත්වීයාමක් සිදුවිය. නව නිෂ්පාදන සොයාගැනීම් සහ පාරිභෝගික චර්යාවේ හා ජීවන රටාවේ වෙනස්කම් මතුවීම මත පෙර දැනුම් දීමකින් තොරව ප්‍රචාරණ නියෝජිත ආයතන ලාභ ලැබීම හෝ පාඩු ලැබීම සාමාන්‍ය දෙයකි.

ප්‍රතිසංවිධානය යනු මෙම පුරෝකථනය කල නොහැකි වාතාවරණයකදී නම්‍යශීලිත්වය ඉහළ නැංවීම සඳහා ඉහළ කළමනාකරණය යෝජනා කරන ලද එක් විසඳුමකි. නමුත් කුමන ආකාරයේ ප්‍රතිසංවිධානයක් ගැලපේද යන්න ඔවුන්ට නිසැකවම කිව නොහැක. ඔවුන් ඔබගේ සහය,

(අ) ඔවුන්ගේ සංදර්භය සහ වර්තමාන ව්‍යුහය විශ්ලේෂණය කරමින්

(ලකුණු 09)

(ආ) ගැටළු හඳුනාගනිමින් සහ

(ලකුණු 09)

(ඇ) නව ව්‍යුහයක් යෝජනා කරමින් අපේක්ෂා කරයි.

(ලකුණු 10)

(මුළු ලකුණු 28)

02. (අ) විවෘත පද්ධති දෘෂ්ටිකෝණය ආවෘත පද්ධති දෘෂ්ටිකෝණයට වඩා උසස්ද? පහදන්න.

(ලකුණු 06)

(ආ) සංවිධානයක ජීවන චක්‍රයේ අදියර සහ සංවිධාන උපාය මාර්ගයන් අතර කුමන හෝ සම්බන්ධතාවයක් ඇතැයි ඔබ සිතන්නේද?

(ලකුණු 06)

(ඇ) ස්ථාවර වාතාවරණයකදී යාන්ත්‍රික ව්‍යුහයක් ආකාර්යක්ෂම වන්නේ ඇයි?

(ලකුණු 06)

(මුළු ලකුණු 18)

03. (අ) සමකාලීන සංවිධාන න්‍යායේ වර්ධනය සඳහා හෝතෝන් අධ්‍යයනයෙන් ගම්‍ය වන්නේ මොනවාද?

(ලකුණු 09)

(ආ) බොහෝ කළමනාකරුවන් මිනිසුන් පිළිබඳ X න්‍යායේ හෝ Y න්‍යායේ අදහස් දරන බව ඔබ සිතනවාද? ඔවුන්ගේ සංවිධාන සැකසුම පිළිබඳ තීරණවලට මෙම දැක්ම කෙසේ බලපායිද?

(ලකුණු 09)

(මුළු ලකුණු 18)

04. (අ) සංවිධාන කාර්යක්ෂමතාවය සහ නම්‍යශීලීත්වය ගැටුම්කාරී අරමුණුද? පහදන්න.

(ලකුණු 06)

(ආ) "ව්‍යාපාර ආයතනයක් සඳහා මූලිකම වන්නේ ලාභයයි. ඔබට එලදායීතාවය පිළිබඳ වෙනත් කිසිම මිනුමක් අවශ්‍ය නොවේ". මෙම ප්‍රකාශයට ආධාර කරන සහ ප්‍රතික්ෂේප කරන තර්කයන් ගොඩ නගන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 18)

05. (අ) සංවිධානවල ඉහළ කළමනාකරණය වඩාත් කැමති වන්නේ උස් හෝ පළල් ව්‍යුහයකටද? හේතු දක්වන්න.

(ලකුණු 06)

(ආ) න්‍යාස ව්‍යුහය පැහැදිලි කරන්න. එය ක්‍රියාත්මක කිරීමට පෙර සංවිධානයක කුමන කොන්දේසි පැවතිය යුතුද?

(ලකුණු 06)

(ඇ) තාක්ෂණය, ප්‍රමාණය, කර්මාන්තය හා ව්‍යුහය අතර සම්බන්ධතාවය කුමක්ද?

(ලකුණු 06)

(මුළු ලකුණු 18)

06. (අ) නිලතන්ත්‍රවාදය තුළ සිටින සේවකයකු ලෙස මෙම ව්‍යුහාත්මක ආකෘතියෙන් ඔබට සපයන ප්‍රතිලාභ මොනවාද?

(ලකුණු 04)

(ආ) "සංකීර්ණතාවයෙන් ඉහළ සංවිධානයක් විධිමත්කරණයයෙන්ද ඉහළ විය හැක" ඔබ එකඟවේද? නොවේද? සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(ඇ) "නිලතන්ත්‍රවාදයේ නීති සහ රෙගුලාසි නොපිළිගත හැකි චර්යාව පමණක් නොව පිළිගත හැකි කාර්යසාධනයේ අවම මට්ටම ද නිර්වචනය කරයි" විවේචනය කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 18)

07. පහත ඕනෑම තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) සංවිධාන සැකසුම සහ තොරතුරු තාක්ෂණය

(ආ) සංවිධානයන්හි නව ප්‍රවණතා

(ඇ) සිරස් තොරතුරු සම්බන්ධතා

(ඈ) සංවිධාන සැකසුමේ උපායශීලී දිශාව

(ඉ) පාරිසරික මූලය

(3x6 = ලකුණු 18)